මාධ්‍ය නිවේදනය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
අ.පෙ.ස. (සා.පෙළ) විභාගය - 2025(2026)
උපකාරක පන්ති පැවැත්වීම තහනම් කිරීම.

2025 අ.පෙ.ස. (සා.පෙළ) විභාගය 2026.02.17 දින සිට 2026.02.26 වන දින දක්වා විභාග මධ්‍යස්ථාන 3545 ක දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

1968 අංක 25 දරණ ප්‍රසිද්ධ විභාග පනතෙහි 22 වගන්තිය යටතේ නිකුත් කර ඇති නියෝග අනුව 2013.06.21 දිනැතිව නිකුත් කරන ලද අංක 1816 ගැසට් නිවේදනය ප්‍රකාරව,

- අ.පෙ.ස. (සා.පෙළ) – 2025(2026) විභාගයට අදාළව 2026.02.11 දින මධ්‍යම රාත්‍රී 12.00 සිට සම්පූර්ණ විභාගය අවසන් වෙන තෙක්,
  - විභාග අපේක්ෂකයින් සඳහා උපකාරක පන්ති පැවැත්වීම සහ එම පන්ති මෙහෙයවීම
  - විෂයානුබද්ධ දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම
  - උක්ත විභාගය සඳහා අනුමාන ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සහ ඒවා බෙදා හැරීම
  - විභාග ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න ලබා දෙන බවට හෝ ඒ හා සමාන ප්‍රශ්න ලබා දෙන බවට පෝස්ටර්, බැනර්, අත්පත්‍රිකා විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රසිද්ධ කිරීම හෝ එවැනි දැ ළඟ තබා ගැනීම සපුරා තහනම් වේ.

යම් අයෙක් හෝ ආයතනයක් හෝ වෙනත් පාර්ශවයක් මෙකී නියෝග නොසලකා ක්‍රියා කරනු ලැබුවහොත් ඒ තැනැත්තා හෝ ආයතනය හෝ එම පාර්ශවය මෙම පනත යටතේ වරදකරුවකු වේ.

කිසියම් තැනැත්තෙකු හෝ ආයතනයක් හෝ පාර්ශවයක් මෙම නියෝග යම් ආකාරයකින් කඩකිරීමක් හෝ උල්ලංඝනය කිරීමක් සිදු කළහොත් ඒ පිළිබඳව ළඟ ම පවතින පොලිස් ස්ථානය හෝ පොලිස් මූලස්ථානය හෝ ශ්‍රී ලංකා විභාග දෙපර්තමේන්තුව වෙත පහත දුරකථන අංක ඔස්සේ පැමිණිලි කළ හැක.

පොලිස් මූලස්ථානය	: 0112421111
පොලිස් හදිසි ඇමතුම් අංකය	: 119
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ක්ෂණික ඇමතුම් අංකය	: 1911
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව	: 0112784208, 0112784537

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්